මගේ අංකය: **ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු - 2024**

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,**
**දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,**
**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,**

***<u>උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ/ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරි, වැඩසටහන් සහකාර සහ ගිණුම් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු - 2024</u>***

2023.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛනගත රජයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරී, වැඩසටහන් සහකාර, ගිණුම් සහකාර තනතුරුවල නිලධාරීන් හා වර්තමාන සේවා ස්ථානයේ වසර හතරක් (04 ක්) සම්පූර්ණ නොකළ ද විශේෂිත හේතූන් මත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් 2024 වර්ෂය සඳහා වූ ස්ථානමාරු අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පල කර ඇති සබැඳියෙහි(link) ඇති **Google Form** අනුව පුරවා **2023.08.25 වන දින පස්වරු 3.00 හෝ එදිනට පෙර** ඉදිරිපත් කළ යුතු අතර ඒ ඒ අධිකරණයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් Google Form හි සඳහන් කළ දත්ත පදනම් කරගනිමින් **"අ" ආකෘතිය** (Specimen Form "A") එක් එක් සේවාවන් අනුව (අධිකරණ ලිපිකරු සේවාව/අධිකරණ ලඝු ලේඛක සේවාව.....ආදී) නිවැරදිව පුරවා එක් ආවරණ ලිපියක් මඟින් ආකෘතිපත්‍ර බහාලන කවරයේ ඉහල වම් කෙලවරෙහි **"<u>පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථාන මාරු - 2024</u>"** වශයෙන් සඳහන් කර 'ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ - 12' යන ලිපිනයට එවිය යුතුය.

02. ඉහත පළමු වැනි ඡේදයේ සඳහන් පරිදි වර්ෂ හතරක් (04 ක්) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නමුත් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන නිලධාරීන් සේවා අවශ්‍යතා මත පුරප්පාඩු පවතින අධිකරණවලට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කරන අතර, එවැනි නිලධාරීන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා නැවත සලකා නොබැලීමට ද අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. ස්ථානමාරු ඉල්ලා සිටීමේ දී නිලධාරීන් විසින් තම කැමැත්ත අනුව අනිවාර්යෙන්ම ස්ථාන තුනක් (03 ක්) නම් කල යුතු ය. **<u>කොළඹ අලුත්කඩේ අධිකරණ සංකීර්ණය හැර එකම අධිකරණ සංකීර්ණය තුල පිහිටි අධිකරණයන් වෙන් වෙන් ස්ථාන වශයෙන් නම් නොකල යුතු</u>** අතර එසේම වර්තමාන සේවා ස්ථානය පිහිටි අධිකරණ සංකීර්ණයේ වෙනත් අධිකරණයක් ද එසේ නම් නොකල යුතුය. **(කොළඹ අලුත්කඩේ අධිකරණ සංකීර්ණය හැර එක් අධිකරණ සංකීර්ණයක් තුළ පිහිටි සියලු අධිකරණ ස්ථාන මාරු කාර්යය සඳහා එක් ස්ථානයක් ලෙස සලකනු ලැබේ.)**

**<u>අයදුම් කලයුතු ආකාරය පිළිබඳ උදාහරණ</u> :-**

**<u>මාතර දිසා අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**
1. තංගල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගාල්ල අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
3. දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය

**<u>තෙල්දෙණිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ සේවයේ නියුතු නිලධාරියකුගේ තේරීම්</u> :**
1. මහනුවර අධිකරණ සංකීර්ණයේ අධිකරණයක්
2. ගම්පොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
3. නාවලපිටිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය

ඒ අනුව ඉහත 03හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් විෂයෙහි ද ඉහත 02හි සඳහන් පරිදි කටයුතු කරනු ලැබිය හැකි බව මෙයින් අවධාරණය කරනු ලැබේ.

04. (අ) 2023 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු ලබාදීමේ දී සඳහන් කළ පරිදි අධිකරණ ලිපිකරු ,අධිකරණ ලඝු ලේඛක, අධිකරණ යතුරු ලේඛක සහ අධිකරණ පොත් බැඳුම්කරු යන තනතුරු ආශ්‍රිතව ඇතැම් ප්‍රදේශවල ඇති වී ඇති සුවිශේෂී තත්වයන් සලකා බලා තම පදිංචි පළාතෙන් පිටත වර්ෂ 04ට වඩා සේවය කළ නිලධරයන්ට තම ස්ථිර පදිංචි පළාත් වලට ස්ථානමාරු ලබා දීම කෙරෙහි අධිකරණ සේවා කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමු වී ඇති අතර එකී නිලධරයන් වෙත ස්ථානමාරු ලබා දීමේ දී ඇතිවන සේවා අවශ්‍යතාව හා අනුප්‍රාප්තික අවශ්‍යතාව ප්‍රකාරව ස්ථානමාරු විෂයෙහි අධික ඉල්ලුමක් පවතින පළාත්වල අධිකරණවල සේවයේ නියුතු නිලධරයන් පහත කාණ්ඩ යටතේ ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**4.1 අධිකරණ ලිපිකරු සහ අධිකරණ පොත් බැඳුම්කරු (රත්නපුර හෝ බදුල්ල දිස්ත්‍රික්ක තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

රත්නපුර හෝ බදුල්ල දිස්ත්‍රික්ක තුළ ස්ථිර පදිංචිය තිබිය දී 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් රත්නපුර හෝ බදුල්ල දිස්ත්‍රික්ක තුළ (අදාල වන පරිදි) අධිකරණයක/අධිකරණවල සේවය

කර ඇති එනම් තම පදිංචි දිස්ත්‍රික්කය තුළම පිහිටි අධිකරණයක සේවය කර ඇති වයස අවුරුදු 55 නොඉක්මවන නිලධාරීන් සහ 2023.12.31 දිනට සේවා කාලය වසර 08 ට අඩු වුවත් රත්නපුර හෝ බදුල්ල දිස්ත්‍රික්ක තුළ ස්ථිර පදිංචිය තිබිය දී එම දිස්ත්‍රික්කයක් තුළම (අදාල වන පරිදි) පිහිටි අධිකරණයකට මුල් පත්වීම ලද වයස අවුරුදු 55 නොඉක්මවන නිලධාරීන්, ස්ථානමාරු අයදුම් කිරීමේ දී <u>අනිවාර්යයෙන්ම</u> රත්නපුර සහ බදුල්ල දිස්ත්‍රික්කවලින් පරිබාහිර අධිකරණ 02ක්වත් තම තේරීම් ලෙස නම් කල යුතු වේ.

**4.2 අධිකරණ ලඝු ලේඛක හා අධිකරණ යතුරු ලේඛක (දකුණු පළාත තුළ ස්ථිර පදිංචි නිලධාරීන් සඳහා පමණි)**

දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය දී 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් දකුණු පළාත තුළ පිහිටි අධිකරණයක/අධිකරණවල සේවය කර ඇති එනම් තම පදිංචි පළාත තුළම පිහිටි අධිකරණයක සේවය කර ඇති වයස අවුරුදු 55 නොඉක්මවන නිලධාරීන් සහ 2023.12.31 දිනට සේවා කාලය වසර 08 ට අඩු වුවත් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය දී එම පළාත තුළම පිහිටි අධිකරණයකට මුල් පත්වීම ලැබ මේ දක්වා දකුණු පළාත තුල සේවය කරන වයස අවුරුදු 55 නොඉක්මවන නිලධාරීන්, ස්ථානමාරු අයදුම් කිරීමේ දී <u>අනිවාර්යයෙන්ම</u> දකුණු පළාතෙන් පරිබාහිර අධිකරණ 02ක්වත් තම තේරීම් ලෙස නම් කල යුතු වේ.

(ආ) ඉහත 4.1 හා 4.2 ඡේදයන්හි සඳහන් කාණ්ඩ වලට අයත් සියලු නිලධරයන් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන බවට ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික විය යුතු ය.

(ඇ) ඉහත 4.1 හා 4.2 ඡේදයන්හි සඳහන් කාණ්ඩ වලට අයත් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරනු නොලබන නිලධාරීන් සේවා අවශ්‍යතාව සහ පුරප්පාඩු සලකා බලා දිවයිනේ ඕනෑ ම ප්‍රදේශයක පිහිටි අධිකරණයකට ස්ථානමාරු ලැබීමට යටත් වේ.

05. මෙම ලිපියේ උපදෙස් ප්‍රකාරව ස්ථාන මාරු අයදුම් කිරීමට නිලධාරීන් වග බලා ගත යුතු අතර ඔවුන් විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථාන ලබාදීමට නොහැකි වන අවස්ථාවන්හි සේවා අවශ්‍යතාවය මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නියමිත සේවා ස්ථානයක් ලබා දෙනු ඇත.

06. දැනට වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කරනු ලැබ සිටින නිලධාරීන් **<u>ස්වකීය ස්ථිර සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පමණක්</u>** ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

07. තම කලත්‍රයා දැනට අධිකරණවල සේවයේ නියුතුව සිටී නම් එවැනි කිසිඳු නිලධාරියෙකු කලත්‍රයා සේවය කරන අධිකරණයටම ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටිය යුතුය.

08. **<u>ස්ථාන මාරු ලබාදීමේ පිළිවෙල</u>**

වර්තමානයේ අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ උග්‍ර හිඟය හේතුවෙන් මානව සම්පත් කළමනාකරණය කර ගැනීමේ දී මතුවන ගැටලු සහගත තත්වය මඟහරවා ගනිමින් අධිකරණ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දෙමින් හැකිතාක් දුරට නිලධාරීන්ගේ ඉල්ලීම් ද ඉටු කිරීමට හැකි වැඩ පිළිවෙලක් සලකා බලනු ලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර ගනු නොලැබේ.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2023 අගෝස්තු මස 08 වෙනි දින,
කොළඹ -12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12